# 8. මහධන සිටුපුත්හුගේ වස්තුව

**ශ්‍රේණිය : 9**

**වාරය : II**

**නිපුණතා මට්ටම් : 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි.**

**3.2 ප්‍රායෝගික භාෂා කාර්යය මැනවින් ඉටුකර ගැනීම සඳහා සිංහල අකාරාදි පිළිවෙළ භාවිත කරයි.**

**<u>ක්‍රියාකාරකම්</u>**

**1. පහත දැක්වෙන ප්‍රශ්න හොඳින් කියවා පෙළ පොත ඇසුරු කර ගනිමින් පිළිතුරු ලියන්න.**

i. 'මහධන සිටුපුත්හුගේ වස්තුව' ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

..........................................................................................................................................

ii. එහි රචකයා නම් කරන්න - ..........................................................................................

iii. එතුමා ජීවත් වූ අවධිය ලියන්න - ..........................................................................................

iv. පහත දැක්වෙන චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථයන් ලියූ කතුවරුන් කවුරුන් ද තෝරා ලියන්න.

1. අමාවතුර - .............................................
2. බුත්සරණ - .............................................
3. පූජාවලිය - .............................................
4. සද්ධර්මරත්නාවලිය - .............................................
5. සද්ධර්මාලංකාරය - .............................................

| |
|---|
| බුද්ධපුත්‍ර හිමි |
| ධර්මසේන හිමි |
| විද්‍යා චක්‍රවර්ති |
| ගුරුළුගෝමී |
| දෙවන ධර්මකීර්ති හිමි |

v. මෙම ග්‍රන්ථ රචනා වූයේ කෙසේ රස විඳීමට හැකි ලෙස ද?

..........................................................................................................................................

vi. මහධන සිටුපුත්හුගේ වස්තුව ඉදිරිපත් කිරීමේ අරමුණ කුමක් ද?

..........................................................................................................................................

vii. සිටු පවුල් දෙකේ දෙමව්පියන් තම දරුවන්ට ඉගැන්වූ ශිල්ප මොනවා ද?

..........................................................................................................................................

viii. එසේ කිරීමට හේතු වූ සිතුවිලි කුමක් වී ද?

..........................................................................................................................................

ix. සිටු පුත්‍රයා සුරාවට ඇබ්බැහි කිරීමට සුරා සොඬුන් යෙදූ උපක්‍රමය දක්වන්න.

..........................................................................................................................................

x. සිටු පුත්‍රයා තම ධනය විනාශ කර ගත් ආකාරය පිළිවෙළින් දක්වන්න.

..........................................................................................................................................

xi. අවසානයේ සිටු පුතුට හා සිටු දියණියට අත් වූ ඉරණම කෙබඳු වී ද?

..........................................................................................................................................

**2. (අ) කොටසේ දැක්වෙන මෙම යෙදුම්වල අර්ථය (ආ) කොටසින් තෝරා ලියන්න.**

<u>(අ) කොටස</u>

i. පෙර සුවසේ කැම්හ පූම්හ.

......................................................................................................................................

ii. පිනට කන්ට බොන්ට සමර්ථ වූම්හයි කිවූය.

......................................................................................................................................

iii. මාත් එ් බොන්ට වුව මැනව

......................................................................................................................................

iv. මෙයට වඩා පිය යුත්තෙක් නැත

......................................................................................................................................

v. උන්තැන සිටි තැන

......................................................................................................................................

vi. ජීවත් වන උපදෙස් නැති හෙයින්

......................................................................................................................................

vii. විකොට කැවූ ය

......................................................................................................................................

viii. ගෙයිත් හින්ද නො දී නෙරි

......................................................................................................................................

ix. පුරා දී ලූ නියාවට

......................................................................................................................................

x. ඉක්මවා පූ නම්

......................................................................................................................................

xi. කෘෂි වණික් ආදී කටයුත්තක

......................................................................................................................................

xii. සම්පත් වුනුම්හ

......................................................................................................................................

<u>(ආ) කොටස</u>

i. මමත් ඒම බීම බොන්ට වුවොත් මැනවි.
ii. බීමට නම් මෙයට වඩා හොඳ දෙයක් නැත.
iii. නොමිලයේ ම කෑමට බීමට හැකිවේ යි කීවෝය.
iv. මුල් කාලයේ හොඳින් කැවෙමු, බිව්වෙමු.
v. අත්හැර දැමුවේ නම්
vi. විකුණා ගෙන කැවෝය

vii. පෙර නොසෑහෙන ලෙස දුන්නු තරමට

viii. කෘෂිකාර්මික කටයුතු හා වාණිජ ව්‍යාපාර ආදී කටයුත්තක

ix. ආ ගිය සෑම තැනකම

x. ගෙදර විසීමට ඉඩ නොදී පන්නා දැමූ නිසා

xi. වස්තු සම්පත් ඇති අය වූයෙමු

xii. ජීවත් වීමට හරි මග පෙන්වීමට කිසිවෙකු නොමැති නිසා

**3. පහත දැක්වෙන වචනවලට විරුද්ධාර්ථවත් පද පාඩමෙන් සොයා ලියන්න.**

i. නිෂ්ප්‍රයෝජන - ..................................................

ii. කැමති - ..................................................

iii. දුක සේ - ..................................................

iv. එලොව - ..................................................

v. උපන් - ..................................................

vi. කාරිය - ..................................................

vii. ලොවී - ..................................................

viii. කළමනා - ..................................................

ix. දුශ්චරිත - ..................................................

x. ආරම්භයේ - ..................................................

**4. පහත පදවලට සමානාර්ථවත් පදය තෝරන්න. සලකුණක් යොදන්න.**

i. මහත - විශාල / උදාර

ii. සොඬහු - සිටුවරයා / ධූර්තයා

iii. වණික් - වාණිජ / කර්මාන්ත

iv. සාන්දු - අලුත් / සඥුන්

v. මාවුලා - කොට්ට / මෙට්ට

vi. බිතක්කන - අගුව / ඇතුළ

vii. කුඩ මැස්සන් - කුඩා මැස්සන් / කුඩා මසුන්

viii. අඹේණියන් - බිරිඳ / අඟන

ix. සන්තක - අයිති / අවසාන

x. කබල් කෙටි - කැඩුණු කෝටු / වළං කැබලි

5. ධර්මසේන හිමි කතාවේ දී යොදා ගත් උපමා තුනක් ලියන්න.

i. ..............................................................................................................................

ii. ..............................................................................................................................

iii. ..............................................................................................................................

6. බුදුන් වහන්සේ විසින් වදාළ සිටු දෙමහල්ලන් විසින් අහිමි කර ගත් මෙලොව පරලොව සැප වගුවේ ලියන්න.

| අවස්ථාව | ගිහි සැප (ලොව්) | පැවිදි සැප (ලොවුතුරා) |
|---|---|---|
| පළමු වයස | | |
| මධ්‍යම වයස | | |
| කෙළවර වයස | | |

7. චිරන්තන සම්භාව්‍ය සාහිත්‍ය කෘති කියැවීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන ලියන්න.

i. ..............................................................................................................................

ii. ..............................................................................................................................

iii. ..............................................................................................................................

iv. ..............................................................................................................................

v. ..............................................................................................................................

## ස්වභාවෝක්ති

යමක ඇති දෙයක් ඒ සැටියෙන් ම දැක්වීම ස්වභාවෝක්තිය ලෙස හැඳින්වේ. සාහිත්‍ය නිර්මාණ රසවත් කිරීමට යොදා ගන්නා කාව්‍ය උපක්‍රමයක්, අලංකාරයක් ලෙස හැඳින්විය හැකිය.

උදාහරණයක් ලෙස මෙම කවිය බලමු.

ගොඩ මඩ දෙකම සරුසාරය පලබරය
කටුරොද ගම්මාන තරමක පිටිසරය
ඒ ගම මැදින් ගලනා ගඟ මනහරය
කඩමණ්ඩිය පිහිටියේ ගම කෙළවරය
(සුදෝ සුදු - සාගර පලන්සූරිය)

මෙහි දී අපට පිටිසර ගමක් පිළිබඳව එහි පවත්නා ස්වරූපය ම ඉදිරිපත් කෙරේ.

## අතිශයෝක්තිය

යමක ඇති තත්ත්වය ඉක්මවා වැඩියෙන් දැක්වීම අතිශයෝක්තිය නම් වේ.

උදාහරණයක් ලෙස මෙම කවිය කියවා බලන්න.

වලඳින අදහසින් මෙන් සුරගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන
වෙළලස පැවති මුතුසක් පබළු බබළන
බල මහ මුහුද එම සඳ උතුරින් පෙනෙන
(සැළලිහිණි සන්දේශය)

මෙහි දී මුහුදේ චණ්ඩ බව දැක්වීම සඳහා මුහුදු රැල්ල අහසට නැගෙන බව කීම පමණ ඉක්මවා කීමකි.

<u>ක්‍රියාකාරකම</u>

**පිළිතුරු ලියන්න.**

1. ස්වභාවෝක්තිය යනු කුමක් ද?

   .........................................................................................................................................

2. අතිශයෝක්තිය යන්න හඳුන්වන්න.

   .........................................................................................................................................

3. බුත්සරණ කෘතියේ රචකයා නම් කරන්න.

   .........................................................................................................................................

4. ගිරා සන්දේශය කිනම් යුගයේ රචනා වූවක් ද?

   .........................................................................................................................................

5. පහත වචනවල අර්ථය ලියන්න.

i. සිඟු - ....................................................................................................................

ii. පිළිමල් - ....................................................................................................................

iii. යදඬෙකින් - ....................................................................................................................

iv. අසනිපාතයක් - ....................................................................................................................

v. කිඳලෙකි - ....................................................................................................................

vi. වෙර - ....................................................................................................................

vii. මළුවෙකි - ....................................................................................................................

viii. නිරිඳු - ....................................................................................................................

## <u>අකාරාදි පිළිවෙළ හා ශබ්දකෝෂ භාවිතය</u>

**පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1. අකාරාදි පිළිවෙළ යන්න හඳුන්වන්න.

   ....................................................................................................................

2. අකාරාදි පිළිවෙළ භාවිත වන අවස්ථා හතරක් ලියන්න.

   ....................................................................................................................

   ....................................................................................................................

   ....................................................................................................................

   ....................................................................................................................

3. වචනවල මුල් අකුර සමාන ලෙස යෙදුණු විට කළ යුත්තේ කුමක් ද?

   ....................................................................................................................

4. එහි යෙදී ඇති පිල්ලම් ද සමාන වන අවස්ථාවේ දී අකාරාදි පිළිවෙළ සැකසීමට කළ යුත්තේ කුමක් ද?

   ....................................................................................................................

5. පහත දැක්වෙන ශබ්දකෝෂ පිටුවේ එන වචන අනුපිළිවෙළට සකස් කරන්න.

   කලබ, කර්තෘ භාගය, කලකන්දය, කලත්‍රයා - ..........................................................................

6. පහත දැක්වෙන ග්‍රන්ථ නාම අකාරාදි පිළිවෙළට සකස් කරන්න.

   i. ගිරා, පරෙවි, හංස, කෝකිල, සැලළිහිණි

      ....................................................................................................................

   ii. සිරිත්මල්දම, ලෝකෝපකාරය, ලෝ වැඩ සඟරාව, සුභාෂිතය

      ....................................................................................................................

   iii. ගුත්තිල කාව්‍යය, කාව්‍යශේඛරය, කව් සිළුමිණ, මුවදෙව්දාවත

      ....................................................................................................................

## පිළිතුරු

## මහධන සිටුපුත්හුගේ වස්තුව

1. i. සද්ධර්මරත්නාවලිය ii. ධර්මසේන හිමි iii. දඹදෙණි සාහිත්‍ය අවධිය
   iv. 1. ගුරුළුගෝමි 2. විද්‍යා චක්‍රවර්ති 3. බුද්ධ පුත්‍ර හිමි
   4. ධර්මසේන හිමි 5. දෙවන ධර්මකීර්ති හිමි
   v. දෙසවනින් අසා
   vi. කළමනා දේ තිබිය දී නොකළමනා දෙය කරන්නවුන්ට වන විපත හැඟවීමට
   vii. ගී හා නැටුම්
   viii. අපගේ සම්පත මහත ......... කැමති පමණකට ඇත. සෙස්ස හැ'යි.
   ix. රාත් හැරගෙන බැඳී දඩ මස හා ලුණුත් එකුරුත්තේ බැඳගෙන
   මුලපලා මුලුත් හැර ගෙන ....... රා බී පියා ලුණු කටලා
   ගෙන මුල පලා මුල් කමින් සිටු පුත්‍රයා පොලඹවා ගැනීම
   x. 1. සිටු පුත්‍රයා රා බොන බව දැන පිරිවර රොක් වීම
   2. රන් යවා රා ගෙන්වා ගෙන බීම
   3. මත් වූ පසු එක් එක් පුද්ගලයන්ට බෙදා දීම
   4. අවසන සන්තක සියලු දේ විකුණාගෙන කෑම
   xi. සිඟාලත් අහරින් යැපීමට

2. i - iv vi - xii xi - viii
   ii - iii vii - vi xii - xi
   iii - i viii - x
   iv - ii ix -vii
   v - ix x - v

3. i. ප්‍රයෝජන ii. නො කැමති iii. සැප සේ iv. මෙලොව
   v. නූපන් vi. අකාරිය vii. ලොවුතුරා viii. නොකළමනා
   ix. සුචරිත x. අවසානයේ

4. i. විශාල ii. ධූර්තයා iii. වාණිජ iv. සඳුන් v. මෙට්ට vi. අගුව vii. කුඩා මසුන් viii. බිරිඳ ix. අයිති
   x. වළං කැබලි

5. i. පැන් සිඳීමෙන් කුඩ මැස්සන් නැති විල්වල පියාපත් වගුළ කොස්වා ලිහිණියන් මෙන්
   ii. විල පැන් නැත්තා මෙන්

iii. කුඩ මැස්සන් නැත්තා මෙන්

iv. විද පූ හී දඬු අවුළන්නන් නැතිව දිරන්නා සේ

v. පියාපත් වගුළ කොස්වා ලිහිණියන්ගේ අහස ගමනක් නැත්තා සේ

6. සිටු පුත්තෙම

| | | |
|---|---|---|
| පළමු වයස | නුවර නායක සිටු තනතුර | රහත් ව ලොවුතුරු සැප |
| මධ්‍යම වයස | දෙවන සිටු තනතුර | අනාගාමී වීම |
| කෙළවර වයස | තුන්වන සිටු තනතුර | සෙදැගැමි වීම |

සිටු දේවී තොමෝ

| | | |
|---|---|---|
| පළමු වයස | නායක සිටු දියණිය | අනාගාමී ඵලය |
| මධ්‍යම වයස | දෙවන සිටු දූ තනතුර | සෙදැගැමි ඵලය |
| කෙළවර වයස | තුන්වන සිටු දූ තනතුර | සෝවාන් ඵලය |

7. i. ධර්ම කරුණු අවබෝධ වීම

ii. යහපත් ජීවිතයකට අවශ්‍ය සදුපදේශ දැන ගැනීම

iii. අසා රසවිඳීමට පෙලඹීම

iv. ශ්‍රවණ කුසලතා වර්ධනය වීම

v. එකල පැවති සමාජ ආර්ථික ආගමික තොරතුරු දැන ගැනීම

vi. සාහිත්‍ය යුග හා විශිෂ්ට කර්තෘන් හඳුනා ගැනීම

vii. එම කෘතිවල වූ විශිෂ්ට භාෂා ලක්ෂණ හඳුනා ගැනීම

viii. එම කෘති පරිශීලනයෙන් තම නිර්මාණ ජීවිතය සකස් කර ගැනීම

ix. විවේකය අර්ථවත්ව ගත කිරීම

x. සාර්ථක, විශිෂ්ට, නිර්මාණශීලී පුරවැසියෙක් බවට පත්වීම

xi. කිසිවිටෙක අයහපත් දේ සඳහා යොමු නොවීම / ධාර්මික වීම

## <u>ස්වභාවෝක්ති</u>

1. 1. යමක් ඇති සැටියෙන් දැක්වීම

2. ඇති තතු ඉක්මවා දැක්වීම

3. විද්‍යා චක්‍රවර්ති

4. කෝට්ටේ යුගයේ

5. i. අං  ii. සතුරු  iii. යකඩ දණ්ඩකින්

iv. හෙණ ගැසීමක්  v. කුඩා දියවළක්  vi. වෛරය

vii. මිදුලකි  viii. රජ, නරනිඳු එහි සමාන පදයක්

# <u>අකාරාදි පිළිවෙළ හා ශබ්දකෝෂ භාවිතය</u>

1. සිංහල අක්ෂර මාලාවේ 'අ' සිට 'ෆ' දක්වා අක්ෂර පිළිවෙළ
2. i. ශබ්දකෝෂවල වචන පෙළගැස්වීම

   ii. විශ්වකෝෂ ග්‍රන්ථවල වචන පෙළ ගැස්වීම

   iii. පුස්තකාලයවල ග්‍රන්ථ නාමාවලි සැකසීම

   iv. දුරකථන නාමාවලි සැකසීම

   v. ඡන්ද ලැයිස්තුවල නාමාවලි සැකසීම

   vi. ප්‍රශ්න පත්‍රවල අනුකොටස් දැක්වීම
3. දෙවන අකුරේ පිළිවෙළ අනුව සකස් කිරීම
4. ඊළඟ අකුර අනුව පිළිවෙළ සකස් කිරීම
5. කලකන්දය, කලත්‍රයා, කලබ, කර්තෘභාගය
6. i. කෝකිල, ගිරා, පරෙවි, සැළලිහිණි, හංස

   ii. ලෝකෝපකාරය, ලෝ වැඩ සඟරාව, සිරිත් මල්දම, සුභාෂිතය

   iii. කව් සිළුමිණ, කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍යය, මුවදෙව්දා වත